**ශ්‍රී ලංකා නිරිතදිග නාගරික සෞඛ්‍යාරක්ෂණ හා සනීපාරක්ෂණ මුලපිරීම් ව්‍යාපෘතිය (අදියර 01) - 2017**

---

ශ්‍රී ලංකා නිරිතදිග නාගරික සෞඛ්‍යාරක්ෂණ හා සනීපාරක්ෂණ මුලපිරීම් ව්‍යාපෘතියේ (අදියර 01) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඒජන්ස් ෆ්‍රාන්සස් ඩී ඩිවෙලොප්මන්ට් අතර 2017 ජුනි 01 දින එළඹි අංක සීඑල්කේ 1013 – 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (එච්) වගන්තිය සහ 2016 මාර්තු 16 දින එළඹී අංක සීඑල්කේ 1013-02 එල් දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, අප ජලය රැස්කිරීම හා පිරිසිදු කිරීමේ පද්ධති ව්‍යාප්ත කිරීම හා 73,000 ක් වූ ජනතාව සඳහා සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම, දිළිඳු හිතකාමී ප්‍රතිපත්ති හා උපාය මාර්ග සංවර්ධනය කිරීම මඟින් අවාසි සහගත නිවැසියන් සඳහා සේවා ප්‍රවේශයට පහසුකම් සැලසීම සහ වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්ව පවත්වා ගැනීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,739.81 කට සමාන යූරෝ මිලියන 107.70 ක් වන අතර ඉන් රු.මිලියන 13,224 කට සමාන යූරෝ මිලියන 76 ක් ණයක් වශයෙන් සහ රු.මිලියන 991.81 කට සමාන යූරෝ මිලියන 5.70 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යයනය කිරීමට ඒජන්ස් ෆ්‍රාන්සස් ඩි ඩිවලොප්මන්ට් එකඟ වී තිබුණි. රු.මිලියන 4,524 කට සමාන ඉතිරි යූරෝ මිලියන 26 ක ශේෂය ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි· කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණ බව සහ

(ඉ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

2007 අගෝස්තු 07 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඉදිරිපත් කර තිබුණේ 2018 දෙසැම්බර් 31 දිනය.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

2017 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද එකතුව රු.624,405 ක් වූ එකතු කළ අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලැබුණ දායකයට එරෙහිව හිලව් කර තිබුණි.

**2.2.3 සැසඳුම් නොකළ ශේෂයන්**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ඉටු කල කාර්යයන්ගේ කෙරී ගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 26.34 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව ඊට සමානුපාතික කෙරී ගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 22.26 ක් වී තිබුණි.

**3 මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | | ණය පහසුකම් ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | 2017 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කරන ලද අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | | **යූරෝ මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **යූරෝ මිලියන** | **රු.මිලියන** |
| ඒඑෆ්ඩී - | ණය | 76.00 | 13,224.00 | - | - | - |
| | ප්‍රදාන | 5.70 | 991.81 | 300 | - | - |
| ශ්‍රී ලංකාව | | 26.00 | 4,524.00 | 300 | 24.77 | 28.16 |
| | එකතුව | **107.70** | **18,739.81** | **600** | **24.77** | **28.16** |

**3.2 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘති ලියකියවිලි අනුව ව්‍යාපෘතියේ කාර්යය මීගමුව ප්‍රදේශයේ සනීපාරක්ෂක යටිතල පහසුකම් වර්ධනය කිරීම. සනීපාරක්ෂක ප්‍රතිපත්ති සැකසීම සහ මීගමුව,ගාල්ල සහ කැළණිය ප්‍රදේශවල සනීපාරක්ෂක යටිතල පහසුකම් සැලසුම් කිරීම නම් වූ සංරචක 03 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.ව්‍යාපෘතියේ අදාල සංරචක යටතේ, උපදේශන සේවා කාර්යට අදාල වූ ප්‍රතිපත්ති සහ

ආයතනික වැඩිදියුණු කිරීම්, සනීපාරක්ෂක කළමනාකරණ කුසලතා වර්ධනය සහ සනීපාරක්ෂක අංශය සඳහා කළමනාකරණ සහය සේවා යනාදිය 2019 අප්‍රේල් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, අදාල උපදේශන සේවා කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි. ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ කාර්යයන්වල භෞතික ප්‍රගතිය සියයට 2.5 ක්ව පැවතිණි.